# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/11 - 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා - 2023.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/1978 (XV) (බී) (II)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්ති සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලයක් වශයෙන් සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (කලින් කලට සංශෝධිත පරිදි වූ) 1986 සැප්තැම්බර් මස 26 වැනි දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, (2022 ජුලි මස 26 වන දින අංක 2290/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) එහි I වන තීරයේ දැක්වෙන, "කලා සහ සංස්කෘතික කටයුතු පීඨය" යන අයිතමයට අනුරූපව, එහි II වන තීරයේ දැක්වෙන "14. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින්, සංශෝධනය කරනු ලැබේ:-

"15. ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයන අංශය".

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0024